## සංචාරක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

**සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපනය ලබාදෙනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ජාතික පුහුණු ආයතනය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයයි**

## කොළඹ - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ඇබෑර්තු

### සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන
(MM 1-2 කාණ්ඩය)

**සුදුසුකම් සහ පළපුරුද්ද**
(1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිළිගත්, මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ / මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක්

**සහ**

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු වෙන්ඩර් / ප්‍රසම්පාදන කටයුතු හැසිරවීම පිළිබඳ එක් වසරක අවම පළපුරුද්ද.

2. ක්ෂේත්‍රයට අදාළ වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍ය පාඨමාලාව සමත් වීම

**සහ**

රාජ්‍ය සේවාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය ආයතන හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වෙන්ඩර් / ප්‍රසම්පාදන කටයුතු හැසිරවීම පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

**වයස:**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් තලය:**
MM 1-2 - රු.54,550/= - 10 x රු.1,375/= - 15 x රු.1,910/=- රු.96,950/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව ජීවන වියදම්, රජය අනුමත කළ දීමනා. ඊට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව වෘත්තීමය දීමනාව රු.3,000/-, සහ දුරකථන දීමනාව මසකට රු. 2,500/- ගෙවනු ලැබේ.

### සහකාර කථිකාචාර්ය - මූල්‍ය
(MM 1-2 කාණ්ඩය)

**සුදුසුකම් සහ පළපුරුද්ද**
(1 හෝ 2 හෝ 03)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිළිගත් මූල්‍ය උපාධියක් / ගණකාධිකරණය / වාණිජ්‍යය / මූල්‍ය කළමනාකරණය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

**සහ**

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු ගණකාධිකරණය පිළිබඳ එක් වසරක අවම පළපුරුද්ද.

2. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක (ICASL/ CIMA / ACCA) අන්තර් මාධ්‍ය පාඨමාලාව සමත්වීම හෝ වෙනත් පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක ඒහා සමාන සුදුසුකම් සමග සහ රාජ්‍ය සේවයේ ගණකාධිකරණය පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

3. ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකයකය ලබා ගැනීම (HNDA)

**සහ**

රාජ්‍ය සේවාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය ආයතන හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණය පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

**වයස:**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් තලය**
MM 1-2 - රු.54,550/= - 10 x රු.1,375/= - 15 x රු.1,910/= - රු.96,950/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව ජීවන වියදම්, රජය අනුමත කළ දීමනා. ඊට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව වෘත්තීමය දීමනාව රු.3,000/-, සහ දුරකථන දීමනාව මසකට රු. 2,500/- ගෙවනු ලැබේ.

### ලොන්ඩරි මෙහෙයුම් නිළධාරි
(JM 1-2 කාණ්ඩය)

**සුදුසුකම් සහ පළපුරුද්ද:**
(1 හෝ 2)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක / ආගන්තුක සත්කාර කළමනාකරණය / ආශ්‍රිත සමාජ විද්‍යාව විෂයට අදාළ උපාධියක්

**හෝ**

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ හෝටල් ගෘහ පාලනය පිළිබඳ විශේෂ පූර්ණ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක අවම සේවා පළපුරුද්ද.

**වයස:**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් තලය :**
JM 1-2 - රු.43,355/= - 10 x රු.755/= - 18 x රු.1,135/= - රු.71,335/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව ජීවන වියදම්, රජය අනුමත කළ දීමනා. ඊට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව ගෙවනු ලැබේ.

**පොදු කරුණු**

- **අර්ථසාධක ගෙවීම් : සේවකයා මාසික වේතනයෙන් 10% ක්ද සේව්‍යයා 15% ක්ද අරමුදලට බැර කරනු ලැබේ.**
- **සේවක භාරකාර අරමුදල : සේව්‍යයා විසින් 3% ක ප්‍රමාණයක් අරමුදලට බැර කරනු ලැබේ.**

**සේවකයාට සහ ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයින්ට ආකර්ෂණීය සෞඛ්‍යාරක්ෂණාවරණයකට හිමිකම් ලබනු ඇත.**

ඉල්ලුම් කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන්කොට ඉල්ලුම්පත සමග අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සහතික පත්වල සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ඇතුළුව ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත **2021 මැයි මස 13** වැනි දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.

**අධ්‍යක්ෂ ජෙනරාල්**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය**
**නො. 78, ගාලු පාර, කොළඹ 03.**

**විමසීම් : 0112 208360**